මූලික පිරිවෙන් අවසාන විභාගය

ඇගයීම් වාර්තාව

10-භූගෝල විද්‍යාව

2020

Curriculum
Assessment & Evalution
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපනය ලැබීමට හැකි මඟක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරු ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් භූගෝල විද්‍යාව විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තුන්වන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

දෙවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යුහය, I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය , I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තුන්වන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේද Iප්‍රශ්න පත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතර හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයින්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සංස්කරණ හා ලේඛක මණ්ඩල සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා එලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023.06.30
පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල

එච්.ජේ.එම්.සී.අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක වන මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යාප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දැ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාවට පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සාම්ප්‍රදායික හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී ව හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981 පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයෝ 227ක් විභාගය සමත් වූහ.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂකයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් 02ක්වත් තෝරා ගත යුතු ය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතු ය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතු ය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසාන විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතුවේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

උපදේශකත්වය	:	එච්.ජේ.එම්.සී.අමිත් ජයසුන්දර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	ඩී.ඩී.වයි. සමරසිංහ නියෝජ්‍ය විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන ශාඛාව - ආයතනික විභාග)
විෂය සම්බන්ධීකරණය	:	ඩබ්.එස්.ඩී.වීරසිංහ නියෝජ්‍ය විභාග කොමසාරිස්
සංස්කරණය	:	ආර්.පී.පීරිස් අතිරේක විභාග කොමසාරිස් (විශ්‍රාමික) 321/6,ජෝතිකාරාම මාවත,කළල්ගොඩ,පන්නිපිටිය එම්.පී.රංජනි ධනවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම
ලේඛක මණ්ඩලය	:	ආර්.පී.පීරිස් මයා අතිරේක විභාග කොමසාරිස් (විශ්‍රාමික) 321/6, ජෝතිකාරාම මාවත, කළල්ගොඩ, පන්නිපිටිය එම්.පී.රංජනි ධනවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය,මහරගම ඩී.ඩබ්.ජී.ජේ. බණ්ඩාර සහකාර කථිකාචාර්ය සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම එම්. ඒ. එන්. ඩග්ලස් ගුරු සේවය ෂ (විශ්‍රාමික) 466/1/2,ඉඹිගල, කටුගස්තොට ආර්.ඒ.එස්.කේ.විජේරත්න ගුරු සේවය මප/හඟු.විද්‍යාකීර්ති මහා පිරිවෙන තිස්සපැල, හඟුරන්කෙත
පරිගණක පිටපත සැකසුම	:	ආර්. ඩී. අයි. කේ. රුහුණගේ (දත්ත සටහන් සහකරු)
පිටකවරය නිර්මාණය	:	නිලුපුල් ෂෙහාන් යසරත්න (දත්ත සටහන් සහකරු)

ඇතුළත පිටු පිටු අංකය

1. භූගෝල විද්‍යා විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු 02

1.1. භූගෝල විද්‍යාව විෂය අධ්‍යයනයේ අරමුණු 02

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 03

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 03

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 03

1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 04

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 05

I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය 06

2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 07

2.2 I ප්‍රශ්න පත්‍රය (ප්‍රශ්න 1 සිට 40 දක්වා) 08

2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 12

2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 13

2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 14

2.6 ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණය 16

2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 18

II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය 20 `

3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 21

3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 22

3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 23

3.4 II ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 24

3.5 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 25

3.6 II ප්‍රශ්නපත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 46

4. පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයින් අවධානය යොමුකළ යුතු කරුණු 47

5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා 48

1 භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනයේ අරමුණු

01. පරිසරය හා මිනිසා අතර සබඳතාව හදාරන විෂයයක් ලෙස භූගෝල විද්‍යාව විෂයය අධ්‍යයනය කිරීම.

02. භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.

03. සෞරග්‍රහ මණ්ඩලයේ ස්වභාවය හා එහි ක්‍රියාකාරිත්වය විමර්ශනය කිරීම.

04. ශ්‍රී ලංකාවේ දේශගුණික විශේෂත්වය අගය කිරීම.

05. ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් හඳුනා ගැනීම.

06. තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගෙන, එකිනෙකා සමගත්, පරිසරය සමගත් සුසංයෝගීව ජීවත් වීමට හුරු වීම.

07. ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂී දිවිරැකුම් කුසලතා වර්ධනය කර ගැනීම.

08. භූගෝලීය තොරතුරු ව්‍යාප්තිය නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා සිතියම් භාවිත කිරීමට හුරු වීම.

09. දත්ත හා තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතයට හුරු වීම.

10. වැඩ ලෝකයට සක්‍රීය ලෙස සහභාගී වීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම.

භූගෝල විද්‍යාව විෂය නිර්දේශය (2017)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

මාධ්‍යය	පිරිවෙන්	පෞද්ගලික	එකතුව
සිංහල	502	8	510
ඉංග්‍රීසි	0	0	0
එකතුව	**502**	**8**	**510**

වගුව **1.1**

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පිරිවෙන් අපේක්ෂකයන්		පෞද්ගලික අපේක්ෂකයන්		එකතුව	%
	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%		
A	25	4.98	2	25	27	5.30
B	52	10.36	3	37.5	55	10.78
C	187	37.25	2	25	189	37.06
S	165	32.87	0	0	165	32.35
W	73	14.54	1	12.5	74	14.51
එකතුව	**502**	**100**	**8**	**100**	**510**	**100**

වගුව **1.2**

1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමාර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන (B) සාමාර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමාර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
කොළඹ	04	0	0.00	0	0.00	1	25.00	2	50.00	3	75.00	1	25.00
ගම්පහ	34	1	2.94	3	8.82	11	32.35	10	29.41	25	73.53	9	26.47
කළුතර	35	2	5.71	4	11.43	18	51.43	9	25.71	33	94.29	2	5.71
මහනුවර	56	2	3.57	11	19.64	27	48.21	13	23.21	53	94.64	3	5.36
මාතලේ	17	1	5.88	1	5.88	5	29.41	6	35.29	13	76.47	4	23.53
නුවරඑළිය	16	3	18.75	2	12.50	5	31.25	6	37.50	16	100.00	0	0.00
ගාල්ල	20	1	5.00	3	15.00	8	40.00	5	25.00	17	85.00	3	15.00
මාතර	43	1	2.33	2	4.65	16	37.21	19	44.19	38	88.37	5	11.63
හම්බන්තොට	28	1	3.57	2	7.14	7	25.00	9	32.14	19	67.86	9	32.14
වවුනියාව	00	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00
අම්පාර	16	1	6.25	6	37.50	4	25.00	4	25.00	15	93.75	1	6.25
ත්‍රිකුණාමලය	06	0	0.00	0	0.00	3	50.00	3	50.00	6	100.00	0	0.00
කුරුණෑගල	72	11	15.28	10	13.89	24	33.33	19	26.39	64	88.89	8	11.11
පුත්තලම	01	0	0.00	1		0	0.00	0	0.00	1	100.00	0	0.00
අනුරාධපුර	38	0	0.00	1	2.63	16	42.11	14	36.84	31	81.58	7	18.42
පොළොන්නරුව	11	0	0.00	1	9.09	6	54.55	2	18.18	9	81.82	2	18.18
බදුල්ල	46	1	2.17	5	10.87	13	28.26	15	32.61	34	73.91	12	26.09
මොණරාගල	26	0	0.00	2	7.69	8	30.77	13	50.00	23	88.46	3	11.54
රත්නපුර	09	1	11.11	0	0.00	2	22.22	5	55.56	8	88.89	1	11.11
කෑගල්ල	32	1	3.13	1	3.13	15	46.88	11	34.38	28	87.50	4	12.50
සමස්ත ප්‍රතිඵලය	510	27	5.29	55	10.78	189	37.06	165	32.35	436	85.49	74	14.51

වගුව **1.3**

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	0	0.00	510	100.00
81 - 90	7	1.37	510	100.00
71 - 80	14	2.75	503	98.63
61 - 70	50	9.80	489	95.88
51 - 60	121	23.73	439	86.08
41 - 50	145	28.43	318	62.35
31 - 40	115	22.55	173	33.92
21 - 30	46	9.02	58	11.37
11 - 20	12	2.35	12	2.35
01 - 10	0	0.00	0	0.00
00 - 00	0	0.00	0	0.00

වගුව **1.4**

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- (31- 40) පන්ති ප්‍රාන්තරය සැලකීමේ දී
මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 510 අතුරෙන් ලකුණු 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 115කි. එය ප්‍රතිශතයක් වශයෙන් 22.5%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලකුණු ලබා ඇති සංඛ්‍යාව 173ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 33.92%කි.

I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

2.I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 01 - වාස්තවික වර්ගයේ ප්‍රශ්න 40කින් සමන්විත ය.

මෙය අනිවාර්ය ප්‍රශ්න 40කින් යුක්ත ය. ඒවා පහත පරිදි සකස් වී ඇත.

- ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා වරණ තුනක් අතරින් නිවැරදි වරණය තෝරා කෙටි පිළිතුරු සැපයීම සඳහා සකස් කර ඇත.
- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශවල වැරදි නිවැරදි බව තේරීම සඳහා සකස් කර ඇත.
- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා කෙටි පිළිතුරු සැපයීම සඳහා සකස් කර ඇත.
- ප්‍රශ්න අංක 21 සිට 40 දක්වා වරණ හතරක් අතරින් නිවැරදි වරණය තේරීම සඳහා සකස් කර ඇත.
- එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

2.2 I ප්‍රශ්න පත්‍රය

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා, හිස් ඉර මත ලියන්න.

1. පොළෝ තලයේ විශාලතම ගොඩබිම් ස්කන්ධය හඳුන්වනු ලබන්නේ .... ලෙස ය.
(ද්‍රපත, මහාද්වීපය, අර්ධද්වීපය)

2. කිසියම් ප්‍රදේශයක වායු පීඩනය ප්‍රකාශ කරනු ලබන්නේ ...., වලිනි.
(මිලිලීටර, මිලිමීටර, මිලිබාර්)

3. ලෝකයේ ජල ව්‍යාප්තිය අනුව 1% ක් පමණ .... ලෙස පවතී.
(කරදිය, කිවුල්දිය, මිරිදිය)

4. .... පස ශ්‍රී ලංකාවේ වියළි කලාපයට පමණක් සීමා වී ඇති පස් වර්ගයකි.
(රතු දුඹුරු, දියළු, රතු කහ පොඩ්සෝල්)

5. පෘථිවි අභ්‍යන්තරයේ සිට ඉහළට ගමන් කරන මැග්මා සිසිල් වීමෙන් .... පාෂාණ නිර්මාණය වේ.
(ආග්නේය, අවසාදිත, විපරීත)

6. ශ්‍රී ලංකාවේ මහා පොල් ත්‍රිකෝණය පිහිටා ඇත්තේ කොළඹ, පුත්තලම හා .... ප්‍රදේශ සම්බන්ධ වීමෙනි.
(මාතලේ, දඹුල්ල, කුරුණෑගල)

7. රත්තොට, දංකොටුව, බලංගොඩ යන ප්‍රදේශවල .... නිෂ්පාදන කර්මාන්තය ව්‍යාප්තව ඇත.
(උළු ගඩොල්, පිගන් භාණ්ඩ, ලෝහ භාණ්ඩ)

8. ශ්‍රී ලංකාවේ තේ වැඩි ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ .... රටවලට ය.
(යුරෝපා, ආසියා, මැදපෙරදිග)

9. හිරුගෙන් පැමිණෙන අහිතකර පාරජම්බුල කිරණ වළක්වාලීම සඳහා ....වායුව උපකාරී වේ.
(ඕසෝන්, නයිට්‍රජන්, ආගන්)

10. මිනිසා පරිසරය ගැන නොතකා තම හිතුමතයේ ක්‍රියා කළහොත් පරිසරය පෙරළා මිනිසාට පාඩම් ඉගැන්විය හැකි බව පෙන්වා දෙනු ලබන්නේ .... සූත්‍රයෙනි.
(අධම්මික, චක්කවත්ති සීහනාද, වනරෝපන)

- අංක 11 සිට 15 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11. ස්වාභාවික ඛාදනයෙන්, පස නිර්මාණය වීමට බලපාන ප්‍රධාන සාධකයකි. (නි / වැ)

12. ශ්‍රී ලංකාව ඉතා උසස් වර්ගයේ බෝට්ටු නිෂ්පාදනය කර විදේශ රටවලට අපනයනය කරනු ලැබේ. (නි / වැ)

13. ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය ප්‍රදේශවල වී වගා කරනු ලබන්නේ වාරි ජලයෙනි. (නි / වැ)

14. ජල සම්පත ආරක්ෂා කිරීම සඳහා ගත යුතු වැදගත් ක්‍රියාමාර්ගයක් වන්නේ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීමයි. (නි / වැ)

15. පෘථිවියේ කිසියම් ස්ථානයක පිහිටීම ඉතාමත් නිවැරදිව හඳුනාගැනීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) යොදා ගනී. (නි / වැ)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

16. ශ්‍රී ලංකාවට නැගෙනහිරින් පිහිටි .... බොක්ක ආශ්‍රිත ප්‍රදේශය වාසුළි හටගන්නා කලාපයකි.

17. ලෝකයේ සීත දේශගුණික ප්‍රදේශවල .... වනාන්තර බහුලව ව්‍යාප්තව ඇත.

18. ශ්‍රී ලංකාවේ ඇති ස්වාභාවික රක්ෂිතයකට නිදසුනක් ලෙස .... දැක්විය හැකි ය.

19. ඇලහැර, රත්නපුර හා බක්කම්පිටිය ප්‍රදේශවල ව්‍යාප්තව ඇති වටිනා ඛනිජ වර්ගය .... ය.

20. මෑතකදී ශ්‍රී ලංකාවේ විදුලි බල පද්ධතියට එක් කළ සුළං බලාගාර උද්‍යානය .... ප්‍රදේශයේ පිහිටා ඇත.

- අංක **21** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

21. ක්ෂය නොවන සම්පත් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) සූර්යාලෝකය හා වාතය (2) වාතය හා වනාන්තර
    (3) වනාන්තර හා පස (4) සූර්යාලෝකය හා ඛනිජ (.........)

22. එට්නා ගිනිකන්ද පිහිටා ඇති දූපත කුමක් ද?
    (1) ජිබ්‍රෝල්ටා (2) තස්මේනියා (3) සිසිලිය (4) අයිස්ලන්තය (.........)

23. ගසක අතු විහිදෙන ආකාරයට ශාඛා ගංගා විහිදෙන ජලවහන රටාව කුමක් ද?
    (1) වලයාකාර (2) අරීය (3) ජාලාකාර (4) ශාඛීය (.........)

24. ශ්‍රී ලංකාවේ බටහිර හා දකුණු වෙරළ තීරය ආශ්‍රිතව බහුලව ව්‍යාප්තව ඇති සුළු අපනයන බෝග වර්ගය වනුයේ,
    (1) සාදික්කා ය. (2) කුරුඳු ය. (3) කරඳමුංගු ය. (4) පැඟිරි ය. (.........)

25. නින්න, පැන්සල් කූරු හා පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදාගන්නා ඛනිජ වර්ගය කුමක් ද?
    (1) තඹ (2) සිරිවානා (3) මිනිරන් (4) හුණුගල් (.........)

26. ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යාවක් ව්‍යාප්තව ඇති පළාත කුමක් ද?
    (1) උතුර (2) උතුරුමැද (3) ඌව (4) සබරගමුව (.........)

27. පිළිවෙළින් ජලගැලීම් හා නියඟ ආපදා හේතුවෙන් දැඩි බලපෑමට ලක්වන දිස්ත්‍රික්ක දෙක ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.
    (1) පොළොන්නරුව හා ගම්පහ (2) කෑගල්ල හා මාතලේ
    (3) කළුතර හා මහනුවර (4) කොළඹ හා හම්බන්තොට (.........)

28. සෞම්‍ය දේශගුණ කලාපයට අයත් රටවල් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    (1) ප්‍රංශය, ඉන්දියාව, දකුණු කොරියාව (2) ප්‍රංශය, ඉතාලිය, ජපානය
    (3) ජපානය, බ්‍රසීලය, ඉන්දුනීසියාව (4) ජපානය, මැලේසියාව, ඉතාලිය (.........)

29. පහත දැක්වෙන නිෂ්පාදන කර්මාන්ත අතුරින් විශේෂ අමුද්‍රව්‍ය, විශේෂඥ ශ්‍රමය හා විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය වන කර්මාන්තය කුමක් ද?
    (1) මෝටර් රථ (2) නැව් (3) ගුවන්යානා (4) දුම්රිය (.........)

30. දේශගුණ වෙනස්වීම්වලට වඩාත්ම ඉවහල් වන මානව ක්‍රියාකාරකම් මින් කවරක් ද?
    (1) සත්ත්ව පාලනය (2) වන භායනය (3) ජල දූෂණය (4) පතල් කැණීම (.........)

31. ලෝකයේ ශීත දේශගුණික කලාපය පිහිටා ඇත්තේ,

(1) අක්ෂාංශ $66\frac{1}{2}^{\circ}$ සිට ධ්‍රැව දක්වා ය. (2) අක්ෂාංශ $23\frac{1}{2}^{\circ}$ සිට අක්ෂාංශ $66\frac{1}{2}^{\circ}$ දක්වා ය.

(3) සමකය දෙපස අක්ෂාංශ $23\frac{1}{2}^{\circ}$ දක්වා ය. (4) සමකයේ සිට අක්ෂාංශ $66\frac{1}{2}^{\circ}$ දක්වා ය. (.........)

32. කොවිඩ් 19 රෝගය ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීම නිසා වඩාත් ම බලපෑමට ලක්වූ ආර්ථික ක්ෂේත්‍රය කුමක් ද?

(1) ප්‍රවාහනය (2) ආහාර බෝග වගාව

(3) ධීවර කර්මාන්තය (4) සංචාරක කර්මාන්තය (.........)

33. ටයර්, පොල්තෙල් හා සහල් පිටි නිෂ්පාදනය අයත් වන කර්මාන්ත වර්ගය කුමක් ද?

(1) ආභරණ හා සපත්තු (2) සේවා (3) කෘෂි පාදක (4) ඛනිජ පාදක (.........)

34. ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් (CFC) වායුගෝලයට එකතුවීම වැළැක්වීම ප්‍රධාන අරමුණ කරගනිමින් 1992 දී ඇති කර ගත් ලෝක සම්මුතිය කුමක් ද?

(1) රියෝ (2) රැම්සා (3) මොන්ට්‍රියල් (4) පැරිස් (.........)

● අංක 35 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

ශ්‍රී ලංකාවේ නගරයක වාර්ෂික උෂ්ණත්ව හා වර්ෂාපතන ව්‍යාප්තිය



35. මෙම නගරයට ඉහළම උෂ්ණත්වය සහ පහළම වර්ෂාපතනය ලැබෙන මාසය කුමක් ද?

(1) ජනවාරි (2) ජූනි (3) සැප්තැම්බර් (4) නොවැම්බර් (.........)

36. මෙම නගරයේ අවම උෂ්ණත්වය වාර්තා වන මාස දෙක වනුයේ,

(1) ජනවාරි සහ අප්‍රේල් ය. (2) අප්‍රේල් සහ ජූනි ය.

(3) අගෝස්තු සහ සැප්තැම්බර් ය. (4) ජනවාරි සහ දෙසැම්බර් ය. (.........)

37. වර්ෂාපතනය 300 mm ට වැඩි අගයක් ගන්නා මාස දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ජනවාරි සහ දෙසැම්බර් (2) ජනවාරි සහ පෙබරවාරි

(3) ඔක්තෝබර් සහ නොවැම්බර් (4) නොවැම්බර් සහ දෙසැම්බර් (.........)

38. මෙම නගරය පිහිටා ඇත්තේ කුමන දේශගුණ කලාපයක ද?

(1) කඳුරට තෙත් කලාපය (2) අර්ධ ශුෂ්ක කලාපය

(3) පහතරට වියළි කලාපය (4) පහතරට තෙත් කලාපය (.........)

● අංක 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක යුගල පහ උපයෝගී කර ගන්න.

A. (i) අධිවේගී මාර්ග
(ii) ප්‍රවාහන කාලය

B. (i) කෘෂිනාශක භාවිතය
(ii) ජල දූෂණය

C. (i) අධ්‍යාපන පහසුකම්
(ii) සාක්ෂරතාව

D. (i) උපත් අනුපාතය
(ii) ජන සංක්‍රමණ

E. (i) උන්නතාංශය
(ii) වායු පීඩනය

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩිවීමට හේතුවන සාධක යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) *A* සහ *E* (2) *B* සහ *C* (3) *C* සහ *D* (4) *D* සහ *E* (………)

40. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන සාධක යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) *A* සහ *B* (2) *A* සහ *E* (3) *B* සහ *C* (4) *C* සහ *D* (………)

(ලකුණු 01 × 40 = 40 යි)

❋❋

2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	මහාද්වීපය	21.	(1)
02.	මිලිබාර්	22.	(3)
03.	මිරිදිය	23.	(4)
04.	රතු දුඹුරු	24.	(2)
05.	ආග්නේය	25.	(3)
06.	කුරුණෑගල	26.	(1)
07	පිඟන් භාණ්ඩ	27.	(4)
08.	මැදපෙරදිග	28.	(2)
09.	ඕසෝන්	29.	(3)
10.	චක්කවත්ති සීහනාද	30.	(2)
11.	(නි)	31.	(1)
12.	(නි)	32.	(4)
13.	(වැ)	33.	(3)
14.	(නි)	34.	(1)
15.	(වැ)	35.	(2)
16.	බෙංගාල	36.	(4)
17.	ක්ෂේත්‍රධර	37.	(4)
18.	යාල/රිටිගල/හග්ගල	38.	(3)
19.	මැණික්	39.	(2)
20.	මන්නාරම	40.	(2)

වගුව 2.1

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය



ප්‍රස්තාරය 2.1
(RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 6 හා 14 ප්‍රශ්නවලට ය. එම ප්‍රශ්නවල පහසුතා දර්ශකය 0.88කි. එනම් එම ප්‍රශ්න සඳහා අපේක්ෂකයන්ගෙන් 88% ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව එම ප්‍රශ්නවල පහසුතාව 88% ක් ලෙස දැක්විය හැකි ය.

2.5 I ප්‍රශ්න පත්‍රයේ 1 සිට 20 තෙක් ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය		
	0	1	Missing
1	16.52	82.4	1.07
2	37.55	61.59	0.86
3	62.88	36.7	0.43
4	39.91	59.66	0.43
5	43.99	55.58	0.43
6	11.59	88.2	0.21
7	63.52	36.48	0
8	52.58	47.42	0
9	32.19	67.81	0
10	79.61	19.96	0.43
11	25.11	74.68	0.21
12	86.48	13.3	0.21
13	31.55	68.03	0.43
14	11.59	88.2	0.21
15	60.94	38.84	0.21
16	13.09	82.62	4.29
17	74.25	18.45	7.3
18	76.61	15.45	7.94
19	33.69	54.72	11.59
20	71.24	14.16	14.59

වගුව 2:2

2.5 I ප්‍රශ්න පත්‍රයේ 21 සිට 40 ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය				
		1	2	3	4	Missing
21	1	66.09	6.44	16.31	11.16	0
22	3	11.59	29.83	31.97	25.54	1.07
23	4	6.22	3	25.75	64.81	0.21
24	2	14.38	42.92	15.45	25.97	1.29
25	3	4.29	4.94	81.97	8.37	0.43
26	1	38.41	22.32	23.39	15.24	0.64
27	4	26.61	16.95	13.95	41.2	1.29
28	2	19.96	35.41	16.95	26.82	0.86
29	3	6.87	19.74	68.45	4.51	0.43
30	2	4.51	69.1	17.6	8.15	0.64
31	1	39.91	24.46	17.38	17.6	0.64
32	4	3.86	8.37	9.01	78.54	0.21
33	3	3	28.11	53.22	15.02	0.64
34	1	34.76	24.25	23.82	15.88	1.29
35	2	13.09	68.03	4.08	13.73	1.07
36	4	4.51	20.17	19.1	55.36	0.86
37	4	10.94	5.79	7.73	75.11	0.43
38	3	31.12	21.24	25.32	21.67	0.64
39	2	20.17	46.14	22.1	11.16	0.43
40	2	14.16	49.79	16.31	18.67	1.07

වගුව 2.3

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ගෙන ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

Missing - තීරයේ දක්වා ඇත්තේ කිසිදු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතයයි.

මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020
10 - භූගෝල විද්‍යාව - I පත්‍රය
තේමා අනුව අයිතම විශ්ලේෂණය



ප්‍රස්තාරය 2.2
(RD/16 /5 / MPF / පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රය සඳහා ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

I ප්‍රශ්න පත්‍රයෙහි භෞතික භූගෝල විද්‍යාව, මානුෂ භූගෝල විද්‍යාව, ප්‍රායෝගික භූගෝල විද්‍යාව යන තේමා අනුව ප්‍රශ්න සකස් කර ඇති අතර ඒ ඒ තේමා අනුව ප්‍රශ්න සකස් වී ඇති ආකාරය පහත වගුවේ සඳහන් කර ඇත.

තේමාව	ප්‍රශ්න අංකය
භෞතික	1, 2, 3, 4, 5, 9, 10, 11, 13, 14, 16, 17, 18, 19, 21, 22, 25, 27, 28, 30, 31, 34
මානුෂ	6, 7, 8, 12, 20, 24, 26, 29, 32, 33, 39, 40
ප්‍රායෝගික	15, 23, 35, 36, 37, 38

වගුව 2.4

භෞතික තේමාව

භෞතික තේමාව තුළින් ස්වාභාවික පරිසරයේ ක්‍රියාවලි සහ රටා පිළිබඳ අධ්‍යයනය කෙරේ. මෙම තේමාව වායුගෝලය, ජල ගෝලය, ශිලා ගෝලය හා ජෛව ගෝලයේ මූලික කරුණු පදනම් කරගෙන ඇත. එම තේමාවට අදාළ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 22කි. ඉන් 50%ට වඩා පහසුතාවක් ඇති ප්‍රශ්න සංඛ්‍යාව 13කි. මෙම තේමාව යටතේ පහසුතාව වැඩි ම ප්‍රශ්න අංක 14හි පහසුතාව 88%කි. පහසුතාව අඩු ම 18 ප්‍රශ්නයෙහි පහසුතාව 15%කි.

මානුෂ තේමාව

මානුෂ තේමාව තුළින් මිනිසා හා පරිසරය අතර අන්තර් සම්බන්ධතාව කාලීනව හා අවකාශීය වශයෙන් විග්‍රහ කිරීම හා එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යයනය කෙරේ. එම තේමාවට අදාළ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 12කි. ඉන් 50%ට හෝ ඊට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න සංඛ්‍යාව 5කි. මෙම තේමාව යටතේ පහසුතාව වැඩි ම ප්‍රශ්න අංක 06හි පහසුතාව 88%කි. පහසුතාව අඩු ම 12 ප්‍රශ්නයෙහි පහසුතාව 13%කි.

ප්‍රායෝගික තේමාව

භෞතික හා මානුෂ භූගෝල විද්‍යාත්මක තොරතුරු අවබෝධකර ගැනීම හා ඉදිරිපත් කිරීම සඳහා භාවිත කිරීම මෙම තේමාව යටතේ සිදු කෙරේ. එම තේමාවට අදාළ මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6කි. ඉන් 50%ට වැඩි පහසුතාවක් ඇති ප්‍රශ්න සංඛ්‍යාව 04කි. මෙම තේමාව යටතේ පහසුතාව වැඩි ම ප්‍රශ්න අංක 37හි පහසුතාව 75%කි. පහසුතාව අඩු ම 38 ප්‍රශ්නයෙහි පහසුතාව 25%කි.

තේමාව	පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව	පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව
භෞතික	14 - 88%	18 -15%
මානුෂ	06 - 88%	12 -13%
ප්‍රායෝගික	37 - 75%	38 -25%

වගුව 2.5



ප්‍රස්තාරය 2.3

(RD/16 /5 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

භූගෝල විද්‍යාව I පත්‍රය සැකසීමේ දී පදනම් කරගත් තේමා 3 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව හා එම තේමාව යටතේ ප්‍රශ්න ඉදිරිපත් වී තිබූ ප්‍රතිශතය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.

I ප්‍රශ්න පත්‍රය භෞතික භූගෝල විද්‍යාව තේමාවට වැඩි බරක් තැබෙන සේ සකස් කර ඇත. 1 ප්‍රශ්න පත්‍රයේ ඉහළ සාධනයක් ලබා ගැනීම සඳහා භෞතික භූගෝල විද්‍යාත්මක කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමුකළ යුතු වේ. ස්වාභාවික පරිසරය පිළිබඳ හා එහි ක්‍රියාවලි හා රටා පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ.

ප්‍රායෝගික භූගෝල විද්‍යාව සඳහා අඩු ප්‍රශ්න සංඛ්‍යාවක් I පත්‍රයේ ඇතුළත් වුව ද එම තේමාවේ මධ්‍යක පහසුතාව 54.58%කි. ප්‍රායෝගික තේමාව සුවිශේෂී කොටසක් වන අතර ඒ සඳහා ද වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යෙදවීම වැදගත් වේ.

2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා දෙවරණ, තෙවරණ සහ කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න අන්තර්ගත වේ.

★ 75% හෝ ඊට වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න වනුයේ 1,6,11,14 සහ 16 වේ. මෙම ප්‍රශ්න සියල්ල ම භූගෝල විද්‍යා විෂයයෙහි මූලික මූලධර්ම පදනම්කර ගනිමින් සකසා තිබේ. ස්මරණ ශක්තියෙන් පිළිතුර සැපයිය හැකි වීම මෙම ප්‍රශ්න සඳහා පහසුතාව වැඩි වීමට හේතුවක් විය හැකි ය.

★ මෙම කොටසේ 20% හෝ ඊට වඩා අඩු පහසුතාව සහිත ප්‍රශ්න වනුයේ 10, 12,17,18 සහ 20 යන ඒවාය.

★ ප්‍රශ්න අංක 10 තුළින් පරිසරය හා මිනිසා අතර ඇති සම්බන්ධතාව පිළිබඳ බුදුදහමෙන් ඉගැන්වෙන සූත්‍ර පිළිබඳ දැනුම විමසීම සිදු කර ඇත. එහි පහසුතාව 20%කි. ගුරු මාර්ගෝපදේශයේ විෂය කරුණු ඉගැන්වීමේ දී පරිසරය හා බුදු දහමෙහි ඉගැන්වීම් පිළිබඳව අවශ්‍ය යොමු කිරීම් සිදුකර තිබුණ ද ඒ සම්බන්ධයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයක් යොමු වී නැති බව පෙනේ. බුදු දහම හා භූගෝලීය පරිසරය අතර ඇති සම්බන්ධතාව පිළිබඳ මනා වැටහීමකින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීම මෙහි දී වැදගත් වන බව පැහැදිලි වේ.

★ ප්‍රශ්න අංක 12 හා 20 විෂය නිර්දේශය ආශ්‍රිත යාවත්කාලී වන දැනුම ඇසුරෙන් සකස් කර ඇත. මෙම නූතන විෂය දැනුම පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුවත්භාවය අඩුවීම මෙම ප්‍රශ්න සඳහා පහසුතාව අඩු වීමට හේතුවක් විය හැකි ය. විෂය සම්බන්ධ නූතන තොරතුරු පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමට සිසුන් පෙළඹවීමත්, නූතන දැනුම පිළිබඳ සිසුන්ගේ අවධානය යොමුවන පරිදි ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමත් තුළින් මෙවැනි ප්‍රශ්න සඳහා සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

★ ප්‍රශ්න අංක 17 හා 18 විෂය නිර්දේශයේ නිශ්චිත විෂය කරුණු ඇසුරෙන් සකස් කර ඇත. එම ප්‍රශ්න දෙකෙහි පහසුතාව අනුපිළිවෙලින් 18%ක් සහ 15%කි. එම විෂය කරුණු පිළිබඳ අපේක්ෂයන්ගේ ස්මරණ ශක්තිය අඩුවීම මෙම ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධනය අඩු වීමට හේතු විය හැකි ය. මෙම විෂය කරුණු පහසුවෙන් මතක තබා ගැනීමට හැකි පරිදි ඒ සම්බන්ධ විශේෂ කරුණු සමග රසවත්ව ඉගැන්වීම් කටයුතු සිදු කිරීමත්, මෙවැනි විෂය කරුණු පහසුවෙන් මතක තබා ගත හැකි කෙටි ක්‍රම පිළිබඳ සිසුන් දැනුවත් කිරීමත්, නිරන්තරව මතකය පිරික්සන අභ්‍යාසවල යෙදවීමත් තුළින් මෙවැනි ප්‍රශ්න සඳහා සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

ප්‍රශ්න අංක 21 සිට 40 දක්වා බහුවරණ ප්‍රශ්න අන්තර්ගත වේ.

★ මෙම කොටසේ 75% හෝ ඊට වඩා වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න වනුයේ 25, 32 සහ 37 ප්‍රශ්න වේ. භූගෝල විද්‍යාව විෂයයේ මූලික සංකල්පයන් වන කාලය හා අවකාශීය සබඳතා පිළිබඳව එම ප්‍රශ්නවලින් විමසා ඇත.

★ 25, 32 යන ප්‍රශ්න පාදක කොට ඇති විෂය කරුණු එදිනෙදා ජීවිතයේ භාවිතවන සරල විෂය කරුණු බැවින් එම කරුණු පිළිබඳ අපේක්ෂකයන් තුළ ඇති ඉහළ දැනුවත්භාවය මෙම ප්‍රශ්න සඳහා පහසුතාව වැඩි වීමට හේතුවක් වී තිබිය හැකි ය.

★ ප්‍රශ්න අංක 35,36,37 සහ 38 භූගෝල විද්‍යාත්මක දත්ත විශ්ලේෂණය පිළිබඳ ප්‍රස්තාරයක් ඇසුරින් අසන ලද ප්‍රශ්න හතරකි. ප්‍රස්තාරයෙන් පෙන්වන දේශගුණික ලක්ෂණ ශ්‍රී ලංකාවේ කුමන දේශගුණික කලාපයකට අයත් දැයි උපකල්පනය කර පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න වේ.

* ප්‍රස්තාරයෙන් දැක්වෙන කරුණු අධ්‍යයනය කර, හොඳින් තේරුම් ගෙන අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම මෙහි අරමුණ වේ. 35,36,37 ප්‍රශ්නවල පහසුතාව 50%ට වැඩි වේ. 35,36,37 ප්‍රශ්න මගින් ප්‍රස්තාරයෙන් ඍජුව ම ප්‍රකාශවන දත්තයන් පිළිබඳ විමසා ඇති අතර එම ප්‍රශ්න සඳහා පිළිතුරු පහසුවෙන් තෝරා ගත හැකි වීම එම ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධනය ඉහළ වීමට හේතුවක් වී තිබිය හැකි ය.

* 38 ප්‍රශ්නයේ පහසුතාව 25%ක් වේ. මෙම කොටසෙහි පහසුතාව අඩු ම ප්‍රශ්නය වනුයේ ද අංක 38 ප්‍රශ්නයයි. 38 ප්‍රශ්නයෙන් භූගෝල විද්‍යාව විෂයයෙහි මූලික සංකල්ප ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව විමසා ඇත. එහි නිවැරදි වරණය 3වේ. එය තෝරාගෙන ඇත්තේ විභාග අපේක්ෂකයන්ගෙන් 25.32%කි. වැරදි වරණ අතරින් 1 වරණය අපේක්ෂකයන්ගෙන් 31.12%ක් ද, 2 වරණය 21.24%ක් ද, 4 වරණය 21.67%ක් ද තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට ඉහළ විශ්ලේෂණ හැකියාවක් අවශ්‍ය වේ. එම හැකියාව සිසුන් තුළ ජනිත කිරීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනාව යොදා ගත යුතු වේ. මේ සඳහා දේශගුණික කලාපවල ව්‍යාප්තිය හා දේශගුණය අතර ඇති අන්තර්සබඳතාව පිළිබඳ මනා අවබෝධයක් සිසුන් තුළ ඇති කිරීම හා එයට අදාළ අභ්‍යාසවල යෙදවීම වැදගත් ය. එවැනි අන්තර් සම්බන්ධතාවන් පිළිබඳ වැඩි අවධානයක් ඇතිවන වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් හොඳින් සංවිධානය කළ යුතු ය.

* සමස්තයක් ලෙස ගත් විට I පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා සමස්ත විෂය නිර්දේශය ආවරණය වන පරිදි භූගෝල විද්‍යාව විෂයයෙහි මූලික සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා තිබිය යුතු වේ. තවද I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු තෝරාගත යුතු ප්‍රශ්නවලට වඩා කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නවල පහසුතාව අඩු අගයක් බව නිරීක්ෂණය වේ.
* I පත්‍රයේ ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවිය හැකි ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනිමට ගුරු ශිෂ්‍ය දෙපාර්ශ්වයේ ම අවධානය යොමු විය යුතු ය. මේ සඳහා සිසුන් නිරන්තරවම අභ්‍යාසකරණයට හුරු කරවීම මෙන්ම විශ්ලේෂණාත්මක චින්තනය සඳහා සිසුන්ට මගපෙන්වීම අත්‍යවශ්‍ය වේ. එමෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද ඇතුළත්ව සංවිධානය කර ගැනීම යෝග්‍ය වේ.

  කාලානුරූපී විෂය ආශ්‍රිත දැනුම හා තොරතුරු යාවත්කාලීන කර ගැනීමට සිසුන් යොමුකළ යුතු ය. මේ සඳහා ගුරුභවතුන් ද යාවත්කාලීන විය යුතු ය. විෂය ආශ්‍රිත නව දැනුම හා තොරතුරු එකතුවක් පවත්වාගෙන යාම ද සුදුසු පියවරකි.

II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

II පත්‍රය - කාලය : පැය 02යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත වේ.

I කොටස - මෙම කොටස අනිවාර්ය වේ. එය (අ), (ආ), (ඉ) ලෙස අනුකොටස් **තුනකින්** සමන්විත වේ.

(අ) ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටසක් ඇසුරින් සකස් කෙරෙන ප්‍රශ්න : ලකුණු **10** කි.

(ආ) ශ්‍රී ලංකා සිතියම - ලකුණු කිරීම : ලකුණු **05** කි.

(ඉ) ලෝක සිතියම - ලකුණු කිරීම : ලකුණු **05** කි.

II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **හතකින්** ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ලකුණු 40කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 10 + 05 + 05 + 40 = **60**

3.2 II ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය



ප්‍රස්තාරය 3.1
(RD/16 /2 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

- භූගෝල විද්‍යාව II පත්‍රයේ I කොටසේ 1 ප්‍රශ්නය අනිවාර්ය අතර එය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 100%කි.
- II පත්‍රයේ II කොටසේ ප්‍රශ්න 7ක් ඇතුළත්වන අතර ඉන් ප්‍රශ්න 4ක් තෝරා පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.
- එම තෝරා ගත යුතු ප්‍රශ්න 7 අතුරෙන් 85%ක් වූ වැඩිම අපේක්ෂක පිරිසක් තෝරාගෙන ඇති ප්‍රශ්නය ප්‍රශ්න අංක 08 වේ.
  8 ප්‍රශ්නයේ මුල් කොටස් දෙක ස්වභාවික ආපදා ඇසුරෙන් සකස් කර ඇත. එහි තුන්වන කොටසින් විමසා ඇත්තේ කාලීන ගැටලුවක් වන කොරෝනා රෝගය ව්‍යාප්ත වීම පිළිබඳවයි. එම ප්‍රශ්නය වැඩි අපේක්ෂකයන් පිරිසක් තෝරා ගැනීමට ජන ජීවිතයට බලපාන කාලීන තොරතුරක් ඇසුරෙන් අසන ලද ප්‍රශ්නයක් වීමත් ප්‍රායෝගිකව ම මුහුණ පෑ ගැටලුවක් වීමත් හේතු වී තිබිය හැකි යැ යි සිතිය හැකි ය.
  තෝරා ගැනීමට ඇති ප්‍රශ්න අතුරෙන් අඩුම අපේක්ෂකයන් පිරිසක් තෝරා ඇති ප්‍රශ්නය වන්නේ ප්‍රශ්න අංක 05යි. එය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 31.67%කි. එය භෞතික හා මානුෂ තේමාවන්හි අන්තර් සබඳතා ඇසුරෙන් සකස් කර ඇති අතර ඉගෙනුම් ක්‍රියාවලියේ දී වැඩි අවධානයක් යොමු නොකිරීම අඩු අපේක්ෂක පිරිසක් එම ප්‍රශ්නය තෝරා ගැනීමට හේතු විය හැකි ය.

3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



ප්‍රස්තාරය 3:2 (RD/16 /3 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඒ සඳහා ලකුණු 20 ක් ද ඉතිරි ප්‍රශ්න 7 සඳහා ලකුණු 10 බැගින් ද ලබා දී ඇත.

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණ මගින් පෙන්වා දී ඇත.

I ප්‍රශ්නයට හිමි ලකුණු 20 00- 05, 6-10, 11-15, 16-20 යන පන්ති ප්‍රාන්තර හතරකට වෙන් කර ඇති අතර, එම පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 00-25%, 26-50%, 51-75%, 76-100%ත් ලෙස කාණ්ඩ හතරකට වෙන් කර ඇත.

ඒ අනුව මුළු ලකුණු 20 න් ලකුණු 6-10 ත් අතර ලකුණු ලබා ඇති එනම් ලකුණු 20 න් 26-50%ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 40% කි.

2 සිට 8 දක්වා ප්‍රශ්න 07 සඳහා ප්‍රශ්නයකට හිමි ලකුණු 10, 0-2, 3-5, 6-7, 8-10 යන පන්ති ප්‍රාන්තර හතරකට වෙන් කර ඇති අතර එම ප්‍රාන්තර අනුව ලකුණු ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය ද 00-25%ත්, 26-50%ත්, 51-75%ත්, 76-100%ත් ලෙස කාණ්ඩ හතරකට වෙන් කර ඇත.

උදාහරණයක් ලෙස ප්‍රශ්න අංක 4 සැලකීමේදී මුළු ලකුණු 10න් ලකුණු 3-5%ත් අතර ලකුණු ලබා ඇති එනම් ලකුණු 10න් 26-50%ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 32%කි.

එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

3.4 II ප්‍රශ්න පත්‍රයේ සාධනය පිළිබඳ විශ්ලේෂණය



ප්‍රස්තාරය 3:4
(RD/ 16/ 4 / MPF / පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

01 ප්‍රශ්නයේ (iii) කොටසේ පහසුතා දර්ශකය 0.90කි. එනම් එම කොටස සඳහා අපේක්ෂකයන් 90% සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එහි පහසුතාව 90% කි. අපේක්ෂකයන් අවම සංඛ්‍යාවක් එනම් 8%ක් පමණක් සාර්ථකව පිළිතුරු සපයා ඇති 02 ප්‍රශ්නයේ (ආ) අනුකොටසෙහි පහසුතා දර්ශකය 0.08කි.

3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

1 ප්‍රශ්නය

(අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස (ඇමුණුම අංක 01) අධ්‍යයනය කොට,ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලබාදීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (ඇමුණුම අංක 02) යොදා ගන්න.

අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

(i) A - B රේඛාවෙන් දැක්වෙන භූ ලක්ෂණය කුමක් ද?
(නෙරුව / නිම්නය / කපොල්ල) (ලකුණු 01යි)

නෙරුව

(ii) C අක්ෂරයෙන් දැක්වෙන ලක්ෂණය කුමක් ද?
(දිස්ත්‍රික්ක මායිම / අඩිපාර / වාරිමාර්ගය) (ලකුණු 01යි)

වාරි මාර්ගය

(iii) D අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
(උසාවිය / ඓතිහාසික ස්ථානය / සංචාරක බංගලාව) (ලකුණු 01යි)

ඓතිහාසික ස්ථානය

(iv) ප්‍රධාන මංසන්ධියේ සිට උතුරු මායිම දක්වා දිවෙන A35 මහාමාර්ග කොටසේ දුර කොපමණ ද?
(1 km / 1.75 km / 3.25 km) (ලකුණු 01යි)

1.75km

(v) E අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති ස්වාභාවික වෘක්ෂලතා වර්ගය කුමක් ද?
(ලඳුකැලෑ / වනාන්තර / තණබිම්) (ලකුණු 01යි)

ලඳු කැලෑ

(vi) F අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානයේ දේශාංශ අගය ලියන්න. (ලකුණු 01යි)

81 15

(vii) P අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ සංකේත මඟින් දක්වා ඇති රජයේ සේවා ලබා දෙන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02යි)

පාසල , රෝහල, පොලීසිය (මින් දෙකක්)

(viii) සිතියම්ගත ප්‍රදේශය පිළිබඳව ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත.ඒවා නිවැරදි නම් 'නි' යන්න ද, වැරදි නම් 'වැ' යන්න ද ලියා දක්වන්න.

(a) සිතියම් ප්‍රදේශයේ නැගෙනහිර මායිම අසලින් දිවෙන ගංගාව ගලා බසින්නේ දකුණු දිශාවට ය.

(a) වැ

(b) සිතියම් ප්‍රදේශයේ වී ගොවිතැන සඳහා ගංගා ජලය මෙන්ම වැව් ජලය ද උපයෝගී කරගෙන තිබේ. (ලකුණු 02යි)

(b) නි

1. (අ) භූ ලක්ෂණ සිතියම් කොටස / Topographic Map Section



Scale 1:50 000

(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම (ඇමුණුම අංක 03) අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, ඇමුණුම අංක 03 කඩදාසියෙහි අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියෙහි ලියා දක්වන්න.

(i)	විල්පත්තුව ජාතික වනෝද්‍යානය	(A, B, C)
(ii)	මැණික් ගඟ	(D, E, F)
(iii)	ගම්පහ දිස්ත්‍රික්කය	(G, H, J)
(iv)	නිලාවේලි	(K, L, M)
(v)	මාතලේ සුළු අපනයන බෝග පර්යේෂණායතනය	(P, Q, R)

1. (ආ)



(i) A

(ii) F

(iii) H

(iv) L

(v) R

5

(ඉ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ඇමුණුම 03 බලන්න.)

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර හිමි අක්ෂරය සිතියමෙන් තෝරා, ඇමුණුම 03 කඩදාසි අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.

(i) ඇන්ඩීස් කඳුවැටිය	(A, B, C)
(ii) මිසිසිපි ගඟ	(D, E, F)
(iii) එක්සත් රාජධානිය	(G, H, J)
(iv) සහරා කාන්තාරය	(K, L, M)
(v) ජපන් මුහුද	(P, Q, R)

1. (ඉ)



01වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II පත්‍රයේ I කොටසේ පළමු ප්‍රශ්නය වන මෙය සියලුම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්නයක් වේ.

මෙම ප්‍රශ්නයට අනුකොටස් තුනක් ඇතුළත් අතර එක් එක් අනුකොටස් සඳහා පිළිවෙලින් ලකුණු 10,5,5 බැගින් ලබා දී ඇති අතර එම ප්‍රශ්නය සඳහා මුළු ලකුණු 20ක් හිමි වේ. ඉන්

ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 3%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 15%ක් ද, වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 57%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 43%ක් වේ.



1. මෙම ප්‍රශ්නය ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ සිතියම් කොටස ඇසුරින් සකස් වී ඇත. මෙය අනුකොටස් තුනකින් සමන්විත ය.

(අ) 1:50,000 භූ ලක්ෂණ සිතියම (ලකුණු 10)
(ආ) ශ්‍රී ලංකා ආකෘති සිතියම (ලකුණු 05)
(ඉ) ලෝක ආකෘති සිතියම (ලකුණු 05)

(අ) කොටසේ පහසුතාව වැඩි (iii) අනුකොටසෙහි පහසුතාව 90%කි. පහසුතාව අඩු ම (vi) අනුකොටසෙහි පහසුතාව 26%කි. (iii) කොටසේ ශිෂ්‍ය සාධනය වැඩි වීමට පැහැදිලි සරල සංස්කෘතික සංකේතයක් පිළිබඳව එම ප්‍රශ්නයෙන් විමසා තිබීම හේතු විය හැකි ය. (vi) කොටස අක්ෂාංශ දේශාංශ කොටුදැල 1:50,000 සිතියම තුළ ව්‍යාප්ත වී ඇති ආකාරය ඇසුරෙන් සකස් කර ඇත. එම අන්තර් සබඳතාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් අපේක්ෂකයන් තුළ නොමැති වීම, ශිෂ්‍ය සාධනය අඩු අගයක් වීමට හේතුවක් වී ඇති බව සිතිය හැකි ය. ඒ නිසා සිතියම් අධ්‍යයනයේ මූලික සංකල්ප පිළිබඳව ගුරු සිසු දෙකොටසෙහි ම අවබෝධය හා කුසලතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය ය.

දැනුම පමණක් මේ සඳහා ප්‍රමාණවත් නොවන අතර ඉන් ඔබ්බට එහි භාවිතය විශ්ලේෂණය දෙසට සිසුන් යොමු කළ යුතු ය. නිරන්තර අභ්‍යාසකරණයට ඉඩ ප්‍රස්ථා ලබා දීමත් ඒ සඳහා සුදුසු අභ්‍යාස කේවල හා කණ්ඩායම් වශයෙන් සිදු කිරීමත් තුළින් අඩු ප්‍රවීනතාවක් දක්වන සිසුන් ඉහළ ප්‍රවීනතා මට්ටමකට ගෙන ඒමට හැකිවනු ඇත.

පළමු ප්‍රශ්නයේ (ආ) සහ (ඉ) කොටස් සිතියමක ස්ථාන හඳුනාගැනීම ඇසුරින් සකස් වී ඇත. ඒ අනුව (ආ) කොටසට ශ්‍රී ලංකාවේ සිතියමක් හා (ඉ) කොටසට ලෝක සිතියමක් ඇතුලත් වී ඇත. කෙසේ වුව ද මෙම කොටස් දෙකෙහි ම පහසුතාව තරමක් පහළ අගයක පවතී. සිතියම් ලකුණු කිරීම, හඳුනා ගැනීම ආශ්‍රිතව සිසුන් තුළ පවතින අනවබෝධය මෙයට හේතු විය හැකි ය. සිතියම් ආශ්‍රිත දැනුම වර්ධනය කර ගැනීමට නිරන්තර අභ්‍යාසකරණය වැදගත් ය. මේ සඳහා වෙන් වූ වෙනම පාඩම් ඒකක නොමැති අතර භූගෝල විද්‍යාවේ ස්වභාවය අනුව අවකාශීය ව්‍යාප්තිය, ස්ථානීය පිහිටීම් ප්‍රමුඛ සංකල්ප වන බැවින් ඒවා තහවුරු වන සේ සෑම පාඩම් ඒකකයක් තුළ ම ක්‍රියාකාරකම් සංවිධානය කිරීම වැදගත් ය. නිරන්තරව යාවත්කාලීන වන සිතියම් ලකුණු කිරීමේ අභ්‍යාස එකතුවක් සෑම පාඩමකට ම අදාළ ව පවත්වාගෙන යා යුතු ය.

II කොටස

2.(අ) 'දේශගුණය' යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

කිසියම් ප්‍රදේශයක වායුගෝලීය දිගු කාලීන කාලගුණික දත්ත නිරීක්ෂණය කොට ප්‍රකාශිත සාමාන්‍ය වායුගෝලීය තත්වය / කාලගුණික මූලිකාංගවල දිගු කාලීනව හැසිරීමේ සාමාන්‍ය ස්වභාවය දේශගුණය වේ. **(ලකුණු 02යි)**

(ආ) ශ්‍රී ලංකාවේ දේශගුණය කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න.

- දූපතක් වීම
- භූ විෂමතාව
- භූ රූප, ජලතලා , පාංශු තත්ත්වය
- ආසියානු මහාද්වීපයේ පිහිටීම
- බෙංගාල බොක්කේ පිහිටීම
- ඉන්දීය සාගරයේ පිහිටීම
- නිවර්තන කලාපයේ පිහිටීම **මින් කරුණු 03ක් සඳහා (ලකුණු 03යි)**

(ඉ) (i) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ප්‍රධාන ක්‍රම තුනක් ලියන්න.

- සංවහන / අන්තර් මෝසම්
- මෝසම් (නිරිත දිග , ඊසාන දිග)
- වාසුළි

(ii) ඉන් එකක් මගින් වර්ෂාපතනය ලැබෙන කාලය හා ව්‍යාප්තිය පැහැදිලි කරන්න.

- <u>සංවහන</u>
  මාර්තු, අප්‍රේල් - 100mm
  සැප්තැම්බර්, නොවැම්බර් - 160mm දිවයිනේ බොහෝ ප්‍රදේශ වලට



- <u>නිරිත දිග මෝසම</u>
  මැයි සිට සැප්තැම්බර් දිවයිනේ බටහිර හා නිරිත ප්‍රදේශ වලට වැඩි වර්ෂාව

  <u>ඊසාන දිග මෝසම</u>
  නොවැම්බර් සිට පෙබරවාරි දිවයිනේ ඊසාන ප්‍රදේශ වලට වැඩි වර්ෂාව

  <u>වාසුළි</u>
  බෙංගාල බොක්කේ හටගනී
  නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාසවල බහුලය

ව්‍යාප්තිය හා කාලය විස්තරයට ලකුණු 02යි.
(3 + 2 = ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

02 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



II පත්‍රයේ II කොටසට අයත් වන මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව අංක 3.4 ප්‍රස්තාරය අනුව 63.33%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.

ඉන්,

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 55%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 3%ක් ද ලෙස
අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 13%ක් වන අතර අපේක්ෂකයන් 87%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



දේශගුණය ඒකකයට අදාළ මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්තවන අතර තුන්වන කොටස (i), (ii) වශයෙන් අනුකොටස් දෙකකි.

මෙම ප්‍රශ්නයේ දී (අ) කොටසේ පහසුතාව 16%කි. (ආ) කොටසේ පහසුතාව 8%කි. (ඉ) කොටසේ (i), (ii) අනුකොටස්වල පහසුතාව පිළිවෙලින් 67%ක් හා 25%ක් වේ.

මෙම ප්‍රශ්නයේ පළමු කොටසට පිළිතුරු සැපයීමේ දී නිර්වචන ඉදිරිපත් කිරීම සම්බන්ධව හැකියාව ලබා තිබීම වැදගත් වේ. මේ සඳහා පෙළ පොතේ දී ඇති නිර්වචන හොඳින් අවබෝධ කරගෙන තිබීම ද වැදගත් වනු ඇත. නිර්වචනය නිවැරදිව ලියා දැක්වීම අපේක්ෂකයන්ට දුෂ්කර වී ඇති බව පෙනේ. නිර්වචන පිළිබඳ මනා අවබෝධයක් නොතිබීම ද මෙයට හේතු විය හැකිය. නිර්වචනයක අර්ථවත්බව හා ඊට ඇතුළත්වන මූලික කරුණු වටහා ගැනීමට සිසුන් යොමු කිරීම වැදගත් වේ.

දෙවන කොටස සඳහා පහසුතාව සාපේක්ෂව ඉතා අඩු අගයක් වීමට නියමිත විෂය කරුණු පිළිබඳ නිවැරදි අවබෝධය අපේක්ෂකයන් තුළ නොමැති වීම හේතු වී තිබිය හැකි බව සිතිය හැකිය. මේ සඳහා සිසුන් පෙළ පොත හොඳින් කියවා අවබෝධ කර ගැනීමට යොමු කළ යුතු ය. ගුරුවරයා විසින් විෂය කරුණු මනාව පැහැදිලි වන සේ ඉගෙනුම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ය.

තෙවන කොටසේ (i) අනුකොටසෙහි පහසුතාව 67%කි. එය සාපේක්ෂ ඉහළ අගයකි. ජනප්‍රිය ප්‍රශ්නයක් වීම හා නිරන්තරයෙන් සාකච්ඡාවට භාජනය වන විෂය කොටසක් වීම එයට හේතු වී තිබිය හැකි ය. (ii) කොටසේ පහසුතාව 25%ක් තරම් අඩු අගයක් වන අතර කාලය හා අවකාශීය ව්‍යාප්තිය පිළිබඳ අපේක්ෂකයන් තුළ අවබෝධය මද බව හා එම විෂය කොටස් පිළිබඳ අපේක්ෂකයන්ගේ අඩු අවධානයද එයට හේතු විය හැකි ය.

ගුරු භවතුන් විසින් සිසුන්ට නිර්වචන නිවැරදිව අවබෝධ කරවිය යුතු ය. විෂය කොටස්වල අන්තර් ගත කරුණු ලිවීමට අවබෝධයෙන් හුරුව ලබාදිය යුතු ය. එමගින් සාධන මට්ටම ඉහළනංවා ගැනීමට හැකි ය.

3.(අ) **යාබද ලෝක සිතියම් කොටසේ A හා B ලෙසින් දක්වා ඇති ලෝකයේ විශාලතම නිවර්තන වර්ෂා වනාන්තර දෙක නම් කරන්න.**



A - ඇමසන්

B - කොන්ගෝ **(ලකුණු 02යි)**

(ආ) **නිවර්තන වර්ෂා වනාන්තරවල දක්නට ඇති සුවිශේෂී වෘක්ෂලතා ලක්ෂණ තුනක් දක්වන්න.**

- ඝනට වැඩෙන වනාන්තර - උස ගස්, පළල් පත්‍ර
- සදාහරිත බව - වර්ෂය පුරාම වැඩෙන
- වියන් ස්ථර ගණනාවකින් යුක්ත වීම
- ඉහළ ජෛව විවිධත්වය
- අපිශාක බහුලය **(ලකුණු 03යි)**

(ඉ) **ශ්‍රී ලංකාවේ වනාන්තර රැකගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න.**

- ඇතැම් වනාන්තර රක්ෂිත කලාප ලෙස නම් කිරීම
- අලුත් වන වගා ව්‍යාපෘති ආරම්භ කිරීම
- මහජනතාව දැනුම්වත් කිරීම
- නීති රීති බලගැන්වීම / දඬුවම් ලබා දීම
- සංවර්ධන කටයුතු කිරීමේ දී පරිසර හානිය අවම කිරීම

කරුණු 03කට (ලකුණු 03යි) විස්තරයට (ලකුණු 02යි)
(3 + 2 = ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

03වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

03 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය



II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නයකි. අංක 3.4 ප්‍රස්තාරය අනුව මෙය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 43.33%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.

ඉන්,

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 46%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 12%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 15%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 27%ක් වන අතර අපේක්ෂකයන් 73%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



ස්වාභාවික වනාන්තර මාතෘකාවට අදාළ මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකි.
මෙම ප්‍රශ්නයේ (අ) කොටසේ පහසුතාව 63%ක් ද (ආ) කොටසේ පහසුතාව 27%ක් ද වේ.
(ඉ) කොටසේ ක්‍රියාමාර්ග 3ක් දක්විය යුතු ප්‍රශ්න අනුකොටසේ පහසුතාව 51%ක් ද විස්තර කිරීම කළ යුතු කොටසේ පහසුතාව 38%ක් ද වේ.

මෙම ප්‍රශ්නයේ (අ) කොටසට පිළිතුරු සැපයීමේ දී වනාන්තරවල ගෝලීය ව්‍යාප්තිය පිළිබඳ මූලික දැනුම ලබා තිබීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා සිතියම් අභ්‍යාස පුරුදු පුහුණු වී සිටීම වැදගත් වනු ඇත. සිතියමේ දැක්වෙන වනාන්තර වර්ග දෙක වැඩි අපේක්ෂයන් ප්‍රතිශතයක් නිවැරදිව හඳුනාගෙන ඇති බව කිව හැකි ය. සිසුන් නිරන්තරව ම සිතියම් අභ්‍යාසවල යෙදීමෙන් තවදුරටත් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නංවාලිය හැකි ය.
(ආ) කොටසේ පහසුතාව අඩු අගයක් ගැනීමට නියමිත විෂය කරුණු නිවැරදි ලෙස ග්‍රහණය කොට නොමැති වීම හේතු විය හැකි ය. සිසුන්ට විෂය කරුණු මනාලෙස අවබෝධ කරවීමට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් විෂය කරුණු සම්බන්ධව ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නංවාලිමට කටයුතු කළ හැකි ය.

(ඉ) කොටසේ ක්‍රියාමාර්ග 3ක් දැක්විය යුතු ප්‍රශ්න අනුකොටසේ පහසුතාව 51%කි. ඒ අනුව බොහෝ අපේක්ෂකයන් ඒ සම්බන්ධ ව අවබෝධයක් ඇති බව සිතිය හැකි ය. තවදුරටත් සාධන මට්ටම වැඩි කර ගැනීම සඳහා අවබෝධය ප්‍රගුණ කරවීමට නිරන්තර අභ්‍යාස කරවීම, පෙළ පොත පරිශීලනය සඳහා යොමු කරවීම සිදු කළ හැකි ය. මෙහි විස්තර කිරීම කොටසේ පහසුතාව 38%කි. බොහෝ අපේක්ෂකයන් කරුණු 3ක් පමණක් දක්වා, විස්තර කිරීම අත හැර දැමීම සිදු කර ඇති අතර ශිෂ්‍ය සාධනය වැඩි කිරීම සඳහා සිසුන් ක්‍රියාකාරී ඉගෙනුම්වල යෙදවීම හා නිරන්තර අභ්‍යාසවලට යොමු කිරීම වැදගත් ය.
ගුරු භවතුන් විසින් සිතියම් කොටස් ලකුණු කරවීම, කරුණු ලෙස අවබෝධ කරවීම, විස්තර කර ලියා දැක්වීම නිරන්තරයෙන් සිදු කිරීම මගින් සමස්ත ප්‍රශ්නය සඳහා සිසුන්ගේ සාධන මට්ටම වර්ධනය කර ගත හැකි ය.

4. (අ) ලෝක ජන සංඛ්‍යාවෙන් හතරෙන් තුනක් ව්‍යාප්තව ඇති මහාද්වීප දෙක නම් කරන්න.
(ලකුණු 02යි)

ආසියාව හා අප්‍රිකාව

(ආ) ලෝකයේ ජනාධික කලාප හෙවත් ජන සංකේන්ද්‍රණ තුනක් දක්වන්න.

- නැගෙනහිර ආසියාව
- දකුණු හා අග්නිදිග ආසියාව
- වයඹ දිග යුරෝපය
- ඊසාන දිග උතුරු ඇමරිකාව

මින් තුනක් සඳහන් කිරීම (ලකුණු 03යි)

(ඉ) ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තිය නිසා මතුව ඇති ගැටලු අවම කරගැනීම සඳහා ගත හැකි විසඳුම් තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- ප්‍රාදේශිය සංවර්ධනය හා නැවත ජනතාව පදිංචි කරවීම
- පදිංචි ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය
- සෞඛ්‍ය පහසුකම් වර්ධනය කිරීම
- තට්ටු නිවාස හා නිවාස යෝජනා ක්‍රම ඇති කිරිම
- අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

කරුණු 03ට (ලකුණු 03යි). විස්තරයට ලකුණු (02යි)
(3 + 2 = ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

04 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා



අංක 3.4 ප්‍රස්තාරය අනුව 4 ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 51.67%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 45%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 13%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 23%ක් වන අතර අපේක්ෂකයන් 77%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



ජන සංඛ්‍යාව මාතෘකාවට අදාළ මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් තුනකින් යුක්ත වන අතර (ඉ) කොටසේ විසඳුම් තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කළ යුතු වේ.

මෙම ප්‍රශ්නයේ (අ) කොටසේ පහසුතාව 66%කි. (ආ) කොටසේ පහසුතාව 26%කි. (ඉ) කොටසේ විසඳුම් 3ක් දැක්වීමේ කොටසේ පහසුතාව 14%කි. විස්තර සැපයීමේ කොටසේ පහසුතාව 15%කි. මෙම ප්‍රශ්නයේ (අ) කොටසට පිළිතුරු සැපයීමේ දී මහාද්වීප වශයෙන් ලෝකයේ ජන සංඛ්‍යාව ව්‍යාප්ත වී ඇති ආකාරය පිළිබඳ දැනුම ලබා තිබිය යුතු ය. මේ සඳහා පෙළ පොතේ දක්වා ඇති කරුණු පිළිබඳ අවබෝධය ලබා තිබීම වැදගත් වේ. අපේක්ෂයන්ගෙන් බහුතරයක් මෙම මහාද්වීප තෝරා ඇත. සිසුන් නිරන්තරයෙන් සිතියම් අධ්‍යයන කටයුතුවලට යොමු කිරිම මගින් මේ සම්බන්ධව ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

(ආ) කොටසේ පහසුතාව සාපේක්ෂව අඩු අගයක් ගැනීමට ජන සංකේන්ද්‍ර පිළිබඳ දැනුම අල්ප වීම හේතුවක් විය හැකි ය. මේ සඳහා ජන සංඛ්‍යාව සම්බන්ධ දැනුම වර්ධනයට පියවර ගත යුතු වේ. ඒ සඳහා පෙළ පොත කියවීමට හා හොඳින් අවබෝධ වීමට හැකිවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කළ යුතු වේ. ගුරු භවතාද මේ පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත වීම ද වැදගත් වේ.

(ඉ) කොටසේ පහසුතාව අඩු අගයක් ගැනීමට න්‍යායාත්මක විෂය තොරතුරු ප්‍රායෝගික ව යොදා ගැනීමට අපොහොසත් වීම හේතුවක් වී ඇතැයි සිතිය හැකි ය. ඒ සඳහා සිසුන් පුරුදු පුහුණු කළ යුතු ය. පෙළ පොතේ සඳහන් තොරතුරු ක්‍රියාකාරකම් තුළින් ලබා ගැනීම සඳහා සිසුන් ඉගෙනුමෙහි යොදවමින් අභ්‍යාස කරවීම සුදුසු වේ.

පෙළපොතින් ඉගෙන ගන්නා විෂය කරුණු සැබෑ පරිසරයට ආරෝපණය කොට ඒ තුළින් භූගෝල විද්‍යාත්මක නිගමනවලට එළඹීමට හැකිවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය.

5.

(අ) ශ්‍රී ලංකාව සතු සාගර කලාපය ප්‍රධාන කොටස් තුනකට බෙදා ඇති ආකාරය යාබද සිතියමේ දක්වා ඇත.
එහි දැක්වෙන A හා B කලාප දෙක නම් කරන්න.



(ලකුණු 02යි)

A - රාෂ්ට්‍රීය මුහුද (කලාපය)
B - යාබද මුහුද (කලාපය)

(ආ) ශ්‍රී ලංකාවේ කරදිය ධීවර කර්මාන්තය සඳහා හිතකර ලෙස බලපා ඇති සාධක තුනක් දක්වන්න.

- ශ්‍රී ලංකාව වටා නොගැඹුරු මුහුදු තීරයක් තිබීම
- නොගැඹුරු මුහුදට හොඳින් හිරු එළිය ලැබීම නිසා මත්ස්‍ය ආහාර බහුල වීම
- ගංගා ඇළ දොළ මගින් ගෙනෙන මත්ස්‍ය ආහාර ලැබීම
- දියවැල් නිසා මත්ස්‍ය ආහාර මතු පිටට ඒම **(කරුණු තුනට ලකුණු 03යි)**

(ඉ) (i) ශ්‍රී ලංකාවේ කර්මාන්ත අතුරින් අපනයනය සඳහා යොමු වූ කර්මාන්ත තුනක් සඳහන් කරන්න.

- ඇඟලුම්
- සෙල්ලම් බඩු
- ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ
- ආහාර නිෂ්පාදන
- සම් භාණ්ඩ

(ii) ඉන් එකක් තෝරාගෙන එය රටේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

- විදේශ විනිමය ලැබීම
- රැකියා අවස්ථා උදා වීම
- නව තාක්ෂණය උපයෝගී කර ගැනීම
- විදේශ ආයෝජනය

කරුණු 03ට (ලකුණු 03යි). (විස්තරයට ලකුණු 02යි)
(3 + 2 = ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

05 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

05 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය



II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නයක්වන මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය අංක 3.4 ප්‍රස්තාරය අනුව 31.67%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමි වේ.

ඉන්

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 48%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 42%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 5%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 10%ක් වන අතර අපේක්ෂකයන් 90%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



කර්මාන්ත ඒකකයට අදාළ මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් 3කින් යුක්ත අතර තුන්වන කොටස (i), (ii) වශයෙන් අනුකොටස් 2කි.

මෙම ප්‍රශ්නයේ (අ) කොටසේ පහසුතාව 19%කි. (ආ) කොටසේ පහසුතාව 17%කි. (ඉ) කොටසේ (i), (ii) අනුකොටස්වල පහසුතාව පිළිවෙලින් 22%ක් හා 23%ක් වේ.

අංක 5 ප්‍රශ්නය II කොටසේ සියලුම ප්‍රශ්න අතුරින් පහසුතාව අඩුම ප්‍රශ්නය වේ.

මෙම ප්‍රශ්නයේ (අ) කොටසට පිළිතුරු සැපයීමේ දී සිතියම් පිළිබඳ අවබෝධය දැනුම හා ආභාෂය ලබා තිබිය යුතු ය. මේ සඳහා සිතියම් අභ්‍යාසවල නිරත වී අවබෝධයක් ලබා තිබීම වැදගත්වනු ඇත. සිතියමේ තොරතුරු හඳුනා ගෙන නම් කිරීම දුෂ්කර වී තිබීමට අපේක්ෂයන්ගේ සිතියම් පිළිබඳ අවබෝධය මඳ බව හේතු වී ඇති බව සිතිය හැකි ය. (ආ) කොටසේ පහසුතාව සාපේක්ෂ අඩු අගයක් වීමට න්‍යායාත්මක විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය මඳ බව හේතු වී තිබිය හැකි ය. විෂය කරුණු මනාව අවබෝධ කර නොගැනීම ද ඊට තවත් හේතුවක් විය හැකි ය.

(ඉ) කොටසේ (i) කොටසේ පහසුතාවය 22%කි. අපනයන කර්මාන්ත තුනක් සඳහන් කිරීමට බොහෝ අපේක්ෂකයන් අපොහොසත් වී ඇති බව පෙනේ. අපේක්ෂකයන්ගේ විෂය කරුණු පිළිබඳ අවබෝධය මඳ බව හා ප්‍රායෝගික අවබෝධය මඳ බව ඊට හේතු විය හැකි ය. (ii) කොටසේ පහසුතාව 23%කි. ඒ සඳහා විෂය කරුණු ප්‍රායෝගික ගලපා ගැනිමට නොහැකි වී තිබීම හේතු විය හැකි ය.
ගුරු භවතුන් විසින් සිතියම් පරිහරණය පිළිබඳ අභ්‍යාසවල සිසුන් නිරත කරවීම. න්‍යායාත්මක විෂය කරුණු අවබෝධ කරවීම හා විෂය කරුණු ප්‍රායෝගිකව යොදා ගැනීමට පෙළඹවීම මගින් සිසුන්ගේ සාධන මට්ටම ඉහළ මට්ටමකට රැගෙන යෑමට කටයුතු කළ හැකි ය.

6. (අ) ලෝකයේ යකඩ හා වානේ නිෂ්පාදනයේ පළමු හා දෙවන ස්ථාන ලබාගන්නා රටවල් දෙක අනුපිළිවෙලින් නම් කරන්න.

(අ) චීනය, ජපානය **(අනුපිළිවෙලින් නම් කිරීමට) (ලකුණු 02යි)**

(ආ) ලෝක මෝටර් රථ නිෂ්පාදනයේ නව ප්‍රවනතා තුනක් සඳහන් කරන්න.

- පරිසර හිතකාමී මෝටර් රථ නිපදවීම
- බහු ජාතික සමාගම් මගින් විවිධ රටවල කර්මාන්ත ශාලා පිහිටු වීම
- ඉන්ධන පිරිමැස්ම සඳහා කුඩා මෝටර් රථ නිපදවීම
- දෙමුහුන් මෝටර් රථ නිපදවීම
- විවිධ සේවාවන් සඳහා රථ නිපදවීම
- ස්වයංක්‍රීය උපාංග යෙදීම **කරුණු 03ට (ලකුණු 03යි)**

(ඉ) නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව ඇති වන පාරිසරික ගැටලු තුනක් දක්වා, ඉන් එකකට යෝග්‍ය විසඳුම් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

ගැටලු

- පරිසර දූෂණය (ජලය, ගොඩබිම, වායුව)
- පාංශු ඛාදනය
- සෞඛ්‍ය ගැටළු ඇති වීම
- වන විනාශය

විසඳුම්

- නීති ක්‍රියාත්මක කිරීම
- දැනුවත් කිරීම
- වරදකරුවන්ට දඬුවම් ලබා දීම
- කාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය

ගැටලු 03ට (ලකුණු 03යි.)
විස්තරයට ලකුණු 02යි (ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

06 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

06 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය



II පත්‍රයේ II කොටසට අයත් වන මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය අංක 3.4 ප්‍රස්තාරය අනුව 60%කි. ප්‍රශ්නයට ලකුණු 10ක් ලැබේ.

ඉන්,

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 14%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 36%ක් වන අතර අපේක්ෂකයන් 64%ක් ලබාගෙන ඇත්තේ ලකුණු



ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත පිළිබඳ මෙම ප්‍රශ්නයෙන් විමසා ඇත. ලෝක ආර්ථික කටයුතු පිළිබඳ ශිෂ්‍යයාගේ අවබෝධය මැනීම අපේක්ෂා කර ඇත. සම්පූර්ණ ප්‍රශ්නය අනුකොටස් තුනකින් සැකසී ඇති අතර (අ) සහ (ආ) කොටස් ලෝකයේ කර්මාන්ත පිළිබඳව ද (ඉ) කොටස කර්මාන්ත ආශ්‍රිත ඇතිකරන පාරිසරික බලපෑම් පිළිබඳව ද අපේක්ෂකයන්ගේ අවබෝධය විමසා ඇත. (ඉ) කොටසින් ගැටලු හා විසඳුම් පිළිබඳව විමසීමක් කර තිබේ.

මේ ප්‍රශ්නයේ (අ) කොටසේ පහසුතාව 52%ක් ද (ආ) කොටසේ පහසුතාව 35%ක් සහ (ඉ) කොටසේ අනු කොටස් දෙකෙහි පහසුතා 43%ක් හා 33%ක් ද වේ. (අ) කොටස මගින් ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය ව්‍යාප්තිය පිළිබඳ දැනුම විමසීමට ලක් කර ඇත. සිතියම් ලකුණු කිරීම මගින් ලෝකයේ කර්මාන්ත ව්‍යාප්තිය පිළිබඳ ශිෂ්‍ය සාධන මට්ටම වර්ධනය කර ගත හැකි අතර, ශිෂ්‍යයාට අවශ්‍ය ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සිදු කිරීමට වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

(ආ) කොටසින් ලෝකයේ නූතන කර්මාන්ත සම්බන්ධ දැනුම විමසා ඇත. එම කොටසේ පහසුතාව 35%කි. ලෝකයේ මෝටර් රථ නිෂ්පාදන පිළිබඳව පවතින අපේක්ෂකයන්ගේ දැනුම අඩු මට්ටමක පැවතීම මේ සඳහා හේතු විය හැකි ය. විෂය නිර්දේශයේ හා පෙළපොතේ මෙම තොරතුරු ඍජුවම සඳහන් කර ඇත. මෝටර් රථ නිෂ්පාදනයේ නව ප්‍රවණතා පිළිබඳ සොයා බැලීමට ශිෂ්‍යයන් පෙළඹවීම වැදගත් වේ.

(ඉ) කොටස කොටස් දෙකකින් යුක්ත ය. මෙහි මුල් කොටසින් ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති පාරිසරික ගැටලු පිළිබඳ අවබෝධය ද, දෙවන කොටසේ දී ඒ හා යොදා ගත හැකි විසඳුම් පිළිබඳව ද දැනුම විමසා තිබේ.

මෙහි දී පළමු කොටසෙහි පහසුතාව 43%කි. දෙවන කොටසෙහි පහසුතාව 33%කි. සාපේක්ෂ වශයෙන් පහසුතාව අඩු ප්‍රශ්න කොටසකි.
ලෝකයේ කර්මාන්ත ඇසුරින් සිදුවන පාරිසරික ගැටලු ඒවාට යෙදිය හැකි පිළියම් පිළිබඳ අපේක්ෂකයන්ගේ අවධානය අඩුමට්ටමක් පැවතීම මෙයට හේතු විය හැකි ය.

ගුරු භවතුන් විසින් නව තාක්ෂණයේ යහපත් මෙන්ම අයහපත් ප්‍රතිවිපාක පිළිබඳ ශිෂ්‍ය අවධානය වැඩි වශයෙන් යොමු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කළ යුතු ය. තව ද තාක්ෂණයේ අයහපත් ප්‍රතිඵල මග හරවා ගැනීමට යෙදිය හැකි විසඳුම් ද යෝජනා කිරීම කෙරෙහි ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කළ යුතු ය.

7.
(අ) වතු කෘෂිකර්මාන්තයේ විශේෂ ලක්ෂණ දෙකක් දක්වන්න.

- විශාල වතු ලෙස ව්‍යාප්ත වීම
- ව්‍යාපාරික පදනම
- අපනයන වෙළඳපල මුල්කර ගැනීම
- යටත් විජිතවල විදේශිකයන් විසින් ආරම්භ කිරීම
- විධිමත් සංවිධාන ක්‍රමයක් තිබීම

(ලකුණු 02යි)



(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගාවන් තුනක් සඳහා ප්‍රසිද්ධ දිස්ත්‍රික්ක යුගල තුනක් යාබද සිතියමේ A, B හා C වශයෙන් දක්වා ඇත. එම වගාවන් මොනවා දැයි A, B, C අනුපිළිවෙන් සඳහන් කරන්න.

A - රබර්

B - තේ

C - වී

(ලකුණු 03යි)

(ඉ) ශ්‍රී ලංකාවේ වී වගාවේ දියුණුව සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර, ඉන් එකක බලපෑම විස්තර කරන්න.

- නව බීජ ප්‍රභේද හඳුන්වා දීම
- පොහොර සහනාධාරය
- සහතික මිලට වී මිළදී ගැනීම
- ජල සම්පාදනය (වැව්, වාරි මාර්ග, ජලාශ)
- කෘෂි රක්ෂණය
- ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය
- නවීන තාක්ෂණය හඳුන්වා දීම
- කාබනික පොහොර දේශීය වී වර්ග ප්‍රචලිත කිරීම

කරුණු 03ට (ලකුණු 03යි.) විස්තරයට (ලකුණු 02යි) (ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

07 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

07 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය



II පත්‍රයේ II කොටසට අයත් වන මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය අංක 3.4 ප්‍රස්තාරය අනුව 65%කි. ප්‍රශ්නයට ලකුණු 10ක් ලැබේ.

ඉන්

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 51%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 10%ක් ද ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 33%ක් වන අතර අපේක්ෂකයන් 67%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.

07 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව



07 ප්‍රශ්නයෙහි කොටස්

මානුෂ තේමාව යටතේ ලෝකයේ ආර්ථික කටයුතු ඒකකයට අදාළ මෙම ප්‍රශ්නය ප්‍රධාන කොටස් 3කින් යුක්ත වේ.
මෙම ප්‍රශ්නයේ (අ) කොටසේ පහසුතාව 13%කි. (ආ) කොටසේ පහසුතාව 49%කි. (ඉ) කොටසේ පහසුතාව කරුණු 3 දැක්වීමට හා විස්තර කිරීමට පිළිවෙලින් 58% හා 41%ක් වේ.

මෙම ප්‍රශ්නයේ (අ) කොටසට පිළිතුරු සැපයීමේ දී වතු කෘෂි කර්මාන්තය පිළිබඳ දැනුවත් බව හා අවබෝධය ලබා තිබිය යුතු ය. මේ පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය මද බව පහසුතාව අඩු අගයක් වීමට හේතු වී ඇතැයි සිතිය හැකි ය.

(ආ) කොටසේ පහසුතාව 50% ආසන්න අගයක් ගෙන ඇත. ශ්‍රී ලංකා සිතියමේ දක්වා ඇති තොරතුරු පිළිබඳ අපේක්ෂකයන්ට අවබෝධයක් පැවතීම ඊට හේතු විය හැකි ය. එහෙත් අපේක්ෂකයන් කොටසකට මෙයට පිළිතුරු සැපයීම දුෂ්කර වී ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිතියම් භාවිත නොකිරීම මීට බලපා ඇති ප්‍රධාන හේතුවක් බව සිතිය හැකි ය. භූගෝලීය ව්‍යාප්තිය දැක්වීම සඳහා යොදා ගත හැකි ප්‍රබල උපකරණයක් ලෙස සිතියමේ ඇති වැදගත්කම මෙම කොටසෙහි පහසුතාව දෙස බලන විට මනාව පැහැදිලි වේ.

(ඉ) කොටසේ කරුණු 3ක් දැක්වීමේ කොටස සඳහා පහසුතාව 58%කි. වී වගාව සඳහා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව අපේක්ෂකයන් තුළ අවබෝධයක් පැවතීම ඊට හේතුවක් විය හැකි ය.

එහෙත් විස්තර සැපයීමේ දී පහසුතාව 41%ක් තරම් අඩු වීමට විස්තර කිරීම සඳහා අපේක්ෂකයන් සතු දැනුම හා අඩු අවබෝධය හේතු වී තිබිය හැකි ය. තවද විභාග අපේක්ෂකයන් විස්තර සැපයීම සඳහා දක්වන මන්දෝත්සාහී බව ද මේ සඳහා හේතුවක් විය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී සිතියම් පිළිබඳ අවබෝධය තහවුරු කිරීම, න්‍යායාත්මක විෂය කරුණු මනාව පැහැදිලි කිරීම, ප්‍රායෝගික භාවිතයට හුරු පුරුදු කිරීම, සිතීමේ ශක්තිය වර්ධනය කිරීමට ඇති ක්‍රියාමාර්ග මගින් සිසුන්ගේ සාධන මට්ටම ඉහළ මට්ටමකට ගැනීමට ගුරු භවතුන් සිසුන් උනන්දු කරවිය යුතු ය.

8 (අ) ස්වාභාවික ආපදාවක් යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

ආපදාව යනු ස්වාභාවික උපද්‍රවයක බලපෑම නිසා ප්‍රජාවකට, ඔවුන්ගේ සම්පත් ක්‍රියාකාරකම්වලට සිදුවන හානියයි.

(ලකුණු 02යි)

(ආ) පහත දැක්වෙන උපද්‍රව

A - දේශගුණික

B - භූ විද්‍යාත්මක

C - ජීව විද්‍යාත්මක

ලෙස වර්ග කර දක්වන්න.

(භූමිකම්පා, වාසුළි, ජල ගැලීම්, පැළෑටි රෝග, සුනාමි, වසංගත රෝග)

A - දේශගුණික වාසුළි, ජල ගැලීම්,

B - භූ විද්‍යාත්මක භූමිකම්පා, සුනාමි

C - ජීව විද්‍යාත්මක පැළෑටි රෝග, වසංගත රෝග **(ලකුණු 03යි)**

(ඉ) (i) කොරෝනා වෛරස රෝගය ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත්වලට වඩා බස්නාහිර පළාත තුළ ශීඝ්‍රයෙන් පැතිරීමට බලපෑ ජනගහනය හා සම්බන්ධ සුවිශේෂි ලක්ෂණ තුනක් දක්වන්න.

(ii) ඉන් එක් ලක්ෂණයක් තෝරාගෙන රෝගය පැතිරීමට එය බලපෑ ආකාරය පැහැදිලි කරන්න.

- අධික ජනගහනය
- දෛනික සංක්‍රමණය
- අඩු ආදායම් ලාභීන්ගේ නිවාස (පැල්පත්, මුඩුක්කු)
- අනාරක්ෂිත සෞඛ්‍ය තත්ත්වයන්
- තට්ටු නිවාස අඩු පහසුකම්
- ජන තදබදය

කරුණු 03ට (ලකුණු 03යි.) විස්තරයට (ලකුණු 02යි) (ලකුණු 05යි)

ලකුණු එකතුව 2 + 3 + 5 (ලකුණු 10යි)

08 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

08 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය



II පත්‍රයේ II කොටසට අයත් වන මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය අංක 3.4 ප්‍රස්තාරය අනුව 85%කි. ප්‍රශ්නයට ලකුණු 10ක් ලැබේ.

ඉන්

ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 20%ක් ද, ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ 6ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රමාණය 57%ක් වන අතර අපේක්ෂකයන් 43% ක් ලබාගෙන ඇත්තේ



මෙම ප්‍රශ්නය මගින් ලෝකයේ හට ගන්නා ස්වභාවික ආපදා මෙන්ම වසංගත රෝග පිළිබඳවත් භෞතික හා මානුෂ ගැටලු පිළිබඳවත් විමසීමක් සිදු කෙරේ. මෙම ප්‍රශ්නය (අ) (ආ) (ඉ) ලෙසින් කොටස් තුනකින් සමන්විත වේ.

(අ) කොටස මගින් ස්වභාවික ආපදාව පැහැදිලි කිරීම පිළිබඳ විමසා ඇත. පහසුතාව 13%කි. එය ඉතා අඩු අගයකි. සංකල්පය පිළිබඳ පැහැදිළි අවබෝධයක් නැති වීම මෙයට හේතුවක් විය හැකිය. (මෙම ප්‍රශ්න පත්‍රයේ 3 ප්‍රශ්නයේ දේශගුණය පිළිබඳ නිර්වචනය කිරීමේදී ද මෙම දුර්වලතාව මතු වී තිබිණ.)

(ආ) කොටස A, B, C ලෙස උප කොටස් 3කින් සමන්විත වේ. එම කොටස්වල පහසුතා පිළිවෙලින් 82%, 82% හා 77%ක් වේ. ආපදා වර්ගීකරණය මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත. කාලීන ගැටලු පිළිබඳ ගුරු භවතුන් මනා අවබෝධයක් අපේක්ෂකයන්ට ලබා දී තිබීම හා ප්‍රායෝගික ගැටලුවක් වීම, පහසුතාව ඉහළ අගයක් ගැනීමට හේතු විය හැකි ය. ස්වභාවික ආපදාවලින් ආරක්ෂා වීමේ කුසලතාව පාසල/පිරිවෙන තුළින් සමාජයට ප්‍රේෂණය කිරීමට සිසුවා තුළ මනා අවබෝධයක් ඇති කිරීමට හැකිවන පරිදි ගුරුවරයා තම ඉගැන්වීම් කාර්යය මනාව සංවිධානය කර ගත යුතු ය.

(ඉ) කොටස උප කොටස් දෙකකින් යුක්ත ය. (i) කොටසින් කොරෝනා වසංගතය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ ව්‍යාප්තිය කෙරෙහි බලපාන ජනගහන හා පාරිසරික සාධක පිළිබඳ විමසීමක් කර ඇත. එහි පහසුතාව 52%කි. (ii) කොටසින් එම සාධන හඳුනා ගැනීම තව දුරටත් විමසීමක් කර තිබේ. පහසුතාව 45%කි.
ජනප්‍රිය ප්‍රශ්නයක් වීමත් කාලින සමාජ ගැටලු විමසන ප්‍රායෝගික ගැටලුවක් වීමත්, පහසුතාව ඉහළ අගයක් ගැනීමට හේතු වූවා විය හැකි ය. ජනගහනය පිළිබඳ පොතපතින් උගත් කරුණු වර්තමානයේ බලපාන ගැටලුවකට සම්බන්ධ කිරීමේ දී අපේක්ෂකයන් වැඩි හැකියාවක් දක්වා ඇති බව මෙයින් පැහැදිලි වේ. සිසුවා කාලීන ගැටලු පිළිබඳ තවදුරටත් දැනුවත් කිරීමට හා එම තොරතුරු යාවත්කාලීන කරගැනීමට අවශ්‍ය මගපෙන්වීම් කිරීමට ගුරුභවතුන් සැළකිලිමත් විය යුතු ය.

3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න, තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



ප්‍රස්තාරය 3:4

II ප්‍රශ්න පත්‍රයේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර එහි තෝරා ගැනීම 100%කි. පහසුතාව 53%කි. අපේක්ෂකයන් ප්‍රායෝගිකව සිතියම් අභ්‍යාසවල නිරත නොවීම මෙයට හේතුවක් විය හැකි ය. සිතියම් අභ්‍යාසවල වැඩි වශයෙන් නිරත කරවීම තුලින් ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කළ හැක.

2 ප්‍රශ්නයේ පහසුතාව 29%ක් වන අතර තෝරාගත් සංඛ්‍යාව 63%කි. එමෙන්ම 3 ප්‍රශ්නයේ පහසුතාව 45%ක් වන අතර තෝරා ගැනීම 43%ක් වී ඇත. බැලූ බැල්මට ශ්‍රී ලංකාව ඇසුරෙන් අසන ලද 2 ප්‍රශ්නය අපේක්ෂකයන් තෝරා ගත්ත ද පිළිතුරු සැපයීමේ දී ගැටලුවක් වී ඇති බව පැහැදිළි ය. එම නිසා ප්‍රශ්න තෝරා ගැනීමට පෙර ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා අවබෝධ කර ගැනිම වැදගත් ය.

අනිවාර්ය ප්‍රශ්නය හැර තෝරා ගැනීමට ඇති ඉතිරි ප්‍රශ්නවලින් වැඩිම අපේක්ෂකයන් පිරිසක් තෝරා ගෙන ඇති ප්‍රශ්නය වන්නේ 8 ප්‍රශ්නයයි. ප්‍රශ්නයෙන් විමසා ඇති කරුණු පිළිබඳ අපේක්ෂකයන් තුළ මනා අවබෝධයක් තිබීම එහි පහසුතාව ඉහළ අගයක් ගැනීමට හේතුවක් වී තිබිය හැකි ය.

4 පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

පොදු උපදෙස්

- ප්‍රශ්න පත්‍රයේ දී ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගෙන පිළිතුරු සැපයිය යුතු ය. අනිවාර්ය ප්‍රශ්නය හා තෝරා ගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන්ද, ප්‍රශ්න පත්‍රයට ගතවන කාලය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

- ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා ලබාදෙන අමතර කාලයෙන් (විනාඩි 10) උපරිම ප්‍රයෝජන ලබා ගත යුතු ය. ප්‍රශ්න පත්‍රය සම්පූර්ණයෙන් ම කියවා තමාට හොඳින් ම පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්න තෝරා ගැනීම සඳහා කාලය ඵලදායීව යොදා ගත යුතු වේ.

- I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී ලබා දී ඇති උපදෙස්වලට අනුව එම ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු සැපයිය යුතු ය.

- II පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය. II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඒ සඳහා පිළිතුරු සැපයීමට සපයා ඇති ඇමුනුම් යොදාගත යුතු ය.

- II කොටසින් පහසු ප්‍රශ්න 4ක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ය.

- II පත්‍රයේ සම්පූර්ණ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 5කි.

- ප්‍රශ්න අංක හා අනු අංක පැහැදිලිව දැක්විය යුතු ය.

- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු සැපයිය යුතු ය.

- සෑම පිටුවකම තම විභාග අංකය හා පිටු අංකය පැහැදිලිව සටහන් කළ යුතු ය.

- කෙටි පිළිතුරු හා දීර්ඝ පිළිතුරු ලිවීමේ දී උපදෙස් අනුව පිළිතුරු නිසි පරිදි සැපයිය යුතු ය.

- පිළිතුරුපත් ඇමිණීමේ දී පිටු අංක පිළිවෙලට ඇමිණිය යුතු ය.

- මුල් පිටුවේ විභාග අංකය විෂය හා පත්‍රය ආදිය සඳහන් කළයුතු විස්තර අනිවාර්යයෙන් ම ඇතුළත් කළ යුතු ය.

- නියමිත ප්‍රශ්න 5ට පමණක් පිළිතුරු සැපයිමට කාලය කළමනාකරණය කරගත යුතු අතර වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට කාලය වැය නොකළ යුතු ය.

- මෙම විෂය සඳහා නියමිත කාලය පැය 3කි. (මිනිත්තු 180කි)
  I පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා මිනිත්තු 40-50 අතර කාලයක් යොදා ගැනීම ප්‍රමාණවත් ය.
  II පත්‍රයේ I කොටසට මිනිත්තු 40ක කාලයක් ද II කොටසෙහි ප්‍රශ්න 4 සඳහා මින්තු 80ක කාලයක් ද (20 x 4) යොදා ගැනීම සුදුසු බව යෝජනා කෙරේ.
  ඉතිරි කාලය (මිනිත්තු 10) වැඩ අවසන් කර පිළිතුරු පත්‍ර පිළිවෙලකට ගොනු කර භාර දීම සඳහා යොදා ගන්න.

5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා යෝජනා

- භූගෝල විද්‍යා විෂයය හා සම්බන්ධ න්‍යායාත්මක කරුණු පිළිබඳ ව පෙළපොතේ ඇතුළත් කරුණුවලට අමතරව වෙනත් මූලාශ්‍ර භාවිත කරමින් දැනුම වර්ධනය කරගැනීමට තොරතුරු සම්පාදනය කිරීම.
- භූගෝල විද්‍යා තොරතුරු නිරතුරුව යාවත්කාලීන වන බැවින් ඒ සඳහා නිරන්තර අවධානයෙන් සිටීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අභ්‍යාසකරණයට යොමු කිරීම.
- සිතියම් අභ්‍යාස ඒ ඒ පාඩම ඇසුරින් සිදු කිරීම.
- භූගෝල විද්‍යාත්මක කරුණු වර්තමාන ගැටලුවලට ගළපා විසඳුම් සෙවීමට හුරු කිරීම.
- ඉගෙනගත් න්‍යායාත්මක කරුණු ප්‍රායෝගිකව නිරීක්ෂණයට හා ක්‍රියාකාරී භාවිතයට යොමු කිරීම.
- දත්ත හා තොරතුරු එකතු කිරීම හා පවත්වාගෙන යාම සඳහා සිදුවීම් පොතක් (Event Book) පවත්වාගෙන යාම.
- භූගෝල විද්‍යාවේ ප්‍රායෝගික කොටස් පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර වැඩකටයුතුවලට වැඩි අවධානයක් යොමු කිරීම.
- පරිසර අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම හා ඒ ඇසුරින් ක්‍රමවත් අධ්‍යයන සැලසුම් අනුගමනය කිරීම.
- සිතියම් ලකුණු කිරීම හා ඒ ආශ්‍රිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා නිරන්තර අභ්‍යාසයන්හි යෙදවීම සහ ඒවායින් සිතියම් වැඩපොතක් සකස් කිරීම.
- හැකි සෑම අවස්ථාවකම කණ්ඩායම් වැඩවල නිරත කරවීමෙන් දැනුම කුසලතා, ආකල්ප වර්ධනය කරවීම.
- තොරතුරු ගවේෂණය සඳහා නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට යොමු කිරීම. (අන්තර්ජාල භාවිතය)
- පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම හා සිසුන් ඒවාට සූදානම් කිරීම.
- අවශ්‍යතා සහිත සිසුන් හඳුනාගෙන ඔවුන් සඳහා ප්‍රතිකාර්ය වැඩසටහන් සම්පාදනය කිරීම.
- විෂය දැනුම වර්ධනය කරගැනීම සඳහා වෘත්තීය පාඨමාලා හැදෑරීමට යොමු කිරීම.
- භූගෝල විද්‍යා විෂයයට අදාළව ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ සකස් කිරීම, මිලදී ගැනීම හා භාවිතයට යොමු වීම.
- භූගෝල විද්‍යාව සඳහා ඉගෙනුම් පහසුකම් හා උපකරණවලින් සමන්විත ස්ථානයක් සකස් කිරීම.
- නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප භාවිතය පිළිබඳ හැදෑරීමට (GIS, GPS, RS) යොමු කිරීම.